**ජා-ඇල ප්‍රාදේශීය සභාව**

**----------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**---------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 26 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 21 දිනද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ජාඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණයහිමි ශේෂය තුළ රු.1,299,308 ක් වූ අනෙකුත් ප්‍රතිපාදන වටිනාකම දෙවරක් සටහන් කිරීම හේතුවෙන් ණයහිමි ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නිවැරදි කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 01 යටතේ නිවැරදි කර ඇත. |
| (ii) | 2018 දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා ලෙජර් ගිණුම අනුව ශේෂය රු.54,887,125 ක් වූ අතර භෞතික සත්‍යාපන ශේෂය රු.6,692,484 ක් වුයෙන් රු.48,194,641 ක වෙනස ගැලපීම් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල භෞතික ශේෂය දැක්විය යුතු අතර ලෙජර ගිණුම් සමඟ සැසඳීම් කළ යුතුවේ. | ගිණුම් උපදේශක මහතාගේ උපදෙස් ලබා ගැනීමෙන් මෙම ගිණුම් ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iii) | සභාවට පරිත්‍යාග ලෙස ලැබුණු රු.113,062 ක ආයුර්වේද බෙහෙත් තොගයක් වැරදිමකින් පරිත්‍යාග ගිණුමට හර කර තිබුණි. | අවශ්‍ය ගැළපීම් කර නිවැරදි කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 02 යටතේ නිවැරදි කර ඇත. |
| (iv) | ගබඩා ණය හිමි යටතේ සටහන් විය යුතු රු.975,000.00 ක් වැය යටතේ සටහන් වීම නිවැරදි කිරීමේදී පොදු ගබඩා ගිණුමට හර කිරීමෙන් එම වටිනාකමින් පොදු ගබඩා ගිණුම වැඩියෙන්ද ගබඩා ණය හිමි ගිණුම අඩුවෙන්ද දක්වා තිබුණි. | පොදු ගබඩා ගිණුමේ සහ ණයහිමි ගිණුමේ අදාල ගැලපීම් සිදු කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 03 යටතේ නිවැරදි කර ඇත. |
| (v) | සමාලෝචිත වර්ෂය තුලදී ලැබූ මුද්දර ආදායමින් ලබාගත් ට්‍රැක්ටර් ටේලර් දෙකක් හා කම්පැක්ටර් රථ තුනක් වෙනුවෙන් අඩුකර ගත් රු.11,223,750 ක වටිනාකමක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ජංගම නොවන වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 04 යටතේ නිවැරදි කර ඇත. |
| (vi) | 2018 වර්ෂයේදි ආපසු ලබා ගන්නා ලද ස්ථාවර තැන්පත්වලට අදාල පොලිය ගිණුම් ගත කර තිබියදිත් නැවත රු.29,662,972 ක් ලද පොළි ලෙස බැර කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට ලැබු ස්ථාවර තැන්පත් පොලිය රු.482,268 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර තැන්පත් පොලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 06 යටතේ නිවැරදි කර ඇත. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ මැයි, ජුනි හා දෙසැම්බර් මාස සඳහා රු.2,160,000 ක් වූ ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණය ලැබිය යුතු අදායමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | අදාල මාසවලට අදාල වැටුප් ප්‍රතිපූරණ ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 08 යටතේ නිවැරදි කර ඇත. |
| (viii) | බටුවත්ත උප කර්යාලයට අයත් විනෝද බදු හිඟ ශේෂය රු.61,000 ක් ගිණුම්වලින් අත්හැරි තිබුණි. | වර්ෂයේ නියමිත ආදායම් වියදම් මූල්‍ය හා කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතුවේ. | 2019 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජනල් අංක 09 යටතේ නිවැරදි කර ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08 කට අදාල ගිණුම් අනුව ශේෂ හා ලේඛන/උපලේඛන ශේෂ අතර රු. 162,234,730 ක වෙනසක් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදිව සකස් කිරීමට කටයුතු කරමි. |

(ඇ) අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට පැවත එන නිරවුල් නොකළ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු:236,425 ක් විය. | පෙර සිට පැවත එන ශේෂ නිරවුල් කළ යුතුවේ. | මාස 06 ක කාලයක් ඇතුලත මෙම ගිණුම් ශේෂ සම්බන්ධ ගැටළු ,ගිණුම් උපදේශක මහතාගේ උපදෙස් මත විසදා ගැනීමට කටයුතු සිදුකරමින් පවතින බව දන්වා සිටිමි. |

(ඇ) ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විවිධ තැන්පත් ගිණුමේ හදුනා නොගත් වසර 10 කට වැඩි කාලයක් ඉක්ම වූ රු.106,040,584 ක තැන්පත් ශේෂය සහ වසර කිහිපයක සිට පැවත එන එකතුව රු.14,621,496 ක් වූ ගිණුම් ශේෂ 13 ක් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගිණුම් ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු සිදු කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | මුදල | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| 2018 ජුනි 30 දිනැති අංක LGD/03/2018 දරන පළාත් | 97,160 | මාර්ග සංවර්ධනය කිරීමේදී ව්‍යාපෘති 03 | චක්‍රලේඛය පරිදි කටයුතු | චක්‍රලේඛය ලැබීමෙන් පසු සකස් කරන සියළු |

| | | | |
|---|---|---|---|
| පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5 ඡේදය | ක කොන්ක්‍රීට් මිශ්‍රණයේ සම්පීඩක ශක්තිය හා කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම සම්බන්ධයෙන් පරීක්ෂණාගාර තහවුරුව සඳහා යන වියදම ඇස්තමේන්තුවට ඇතුලත් කර තිබුණද එවැනි පරීක්ෂණයකින් තොරව ඒ සඳහා අදාල සමිති වෙත රු.97.160 ක ගෙවීම් කර තිබුණි. | කළ යුතුවේ. | ඇස්තමේන්තු සඳහා ඝණකම හා සම්පීඩක ශක්තිය යන දෙකම ඇතුළත් ඇස්තමේන්තු සකස් කර ඇති අතර මේ සඳහා ඇත්තේ රාජ්‍ය ආයතන 03 ක් බැවින් මේ සඳහා විශාල ප්‍රමාදයක් සිදුවේ. පුද්ගලික ආයතනයක සම්පීඩක ශක්තිය පරීක්ෂා කළත් ඒ වෙනුවෙන් ගෙවීම් කළ යුතු නිසාත් ඝණකම පිළිබඳ වැඩ අධිකාරී නිර්දේශ කළත් Core Cut කැපීම සඳහා අදාළ ගාස්තු හා යන්ත්‍රයේ ගාස්තු කොන්ත්‍රාත්කරු විසින් අදාළ කොන්ක්‍රීට් කැලි කපන යන්ත්‍ර හිමිකරුට ගෙවීම් කළ යුතුවේ. |

1.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කඳාන උප කාර්යාලයට අයත් කර්මාන්ත හා ව්‍යාපාර බදු රු:104,850 ක්ද, වෙළඳ බලපත්‍ර රු:96,800 ක්ද, සහා සතු නොවන මස් කඩ රු:686,136 ක්ද, වශයෙන් මුළු එකතුව රු:887,786 ක් විධිමත් අනුමැතියකින් තොරව පැරණි හිඟ ලේඛන වලින් ඉවත් කර තිබුණි. | විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ. | මෙම ශේෂය කපාහැරීම සඳහා අනුමැතිය දක්වා ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු:183,525,635 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු:75,969,197 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. ' 000 | රු. ' 000 | රු.' 000 | රු.' 000 | රු.' 000 | රු.' 000 | රු.' 000 | රු.' 000 |
| (i) | වරිපනම් හා බදු | 45,660 | 51,061 | 50,137 | 25,481 | 44,645 | 52.239 | 51,739 | 25,289 |
| (ii) | කුලී | 16,702 | 14,422 | 11,397 | 10,968 | 14,439 | 17,519 | 17,424 | 8,965 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,755 | 2,067 | 2,067 | 93 | 2,794 | 2,423 | 3,751 | 93 |
| (iv) | වෙනත් ආදායම් | 129,561 | 250,065 | 229,860 | 889 | 135,652 | 80,365 | 70,914 | 916 |

### 2.2.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රාගම උපකාර්යාලයේ හා බටුවත්ත උප කාර්යාල වල 2018 ජනවාරි 01 දිනට හිඟය පිළිවෙලින් රු:7,807,908 ක් හා රු:5,012,518 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අය කිරීම රු:2,760,480 හා රු:1,609,055 ක් වූයෙන් අය කිරීම දුර්වල තත්ත්වයක පැවතුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේදී හිඟ වරිපනම් අය කර ගැනීමේදී බටුවත්ත හා රාගම හිග වරිපනම් අය කර ගැනීම සඳහා විනිශ්චය බලපත්‍ර නිකුත් කර ඇත. බටුවත්ත උප කාර්යාලයේ කඩිනමින් හිඟ වරිපනම් අය කිරීම සිදු කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2018 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු:25,289,000 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසානයට එම හිඟය ලෙස රු:25,481,000ක් දක්වා තවදුරටත් වැඩි වී තිබුණි. | හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුවේ. | මෙයට ප්‍රධාන හේතුව වන්නේ බටුවත්ත, රාගම උප කාර්යාල වලින් අය වීමට ඇති හිඟ වරිපනම් බදු අය වීම ඉතා දුර්වල තත්ත්වයක පැවතීමය. |

2.2.3 කුලී

----

| | විගණන නිරීක්ෂණය<br>----------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 01 දිනට වූ හිඟ කුලී ආදායම වූ රු.8,965,000 ක් වුවද ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ අවසානයට එම හිඟය රු.10,968,000 ක් දක්වා වැඩිවී තිබුණි. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතු වේ. | වර්ෂය අවසානයේ කිසිඳු මුදලක් අය කර නොමැති අතර එම හිඟ කපා ඉවත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. |
| (ආ) | කඳාන පොදු වෙළඳපොල අංක 02 දරන ගව මස් වෙළඳසැලෙන් පසුගිය වර්ෂ 05 ක පමණ කාලයක සිට කිසිදු ආදායමක් උපයා ගැනීමට අපොහොසත් වී තිබූ අතර අංක 01 හා 03 මස් කඩ 02 න් මාසික කුලිය හා දඩ මුදල් වශයෙන් ලැබිය යුතු රු:269,402 ක් 2019 ජනවාරි 29 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. | සභා දේපලවලින් ආදායම් උපයා ගැනීම කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා ටෙන්ඩර් කිරීමේදී තක්සේරු වටිනාකම හඳුනා ගනිමින් එය පදනම් කර ගෙන ටෙන්ඩර් ප්‍රදානය කළ යුතු බව දන්වා ඇති අතර තක්සේරු දෙපාර්තමේන්තුවට වාර්තා ඉල්ලා ලිපි යොමුකර ඇතත් මේ වන තෙක් තක්සේරු ලැබී නැත. |
| (ඇ) | ප්‍රාදේශීය සභාවට අයත්, රාගම පොදු වෙළඳ පොළෙහි වූ මස් කඩ 03 න් පෙර වර්ෂය සඳහා බදු කුලී රු.1,041,932 ක් හා දඩ මුදල රු:207,986 ක්ද, සමාලෝචිත වර්ෂය සඳහා බදු කුලිය රු:2,192,299 ක් හා රු:438,458 ක දඩ මුදලක්ද 2019 ජනවාරි 28 දිනට අය විය යුතුව පැවතියදී 2019 වර්ෂය වෙනුවෙන් නැවත එම බදුකරුවන් වෙතම එම කඩ බදු දීමට කටයුතු කර තිබුණි. | නව තක්සේරුව යටතේ ටෙන්ඩර් කර මස් කඩ බදුදීම සිදුකළ යුතු වේ. | 2018 වර්ෂයට අය විය යුතු කඩ කුලිය විධිමත් තක්සේරුවක් මත ලබා ගන්නා නව තක්සේරු වටිනාකම පදනම් කර ගෙන අය කිරීමට පියවර ගන්නා ලෙස 2018 ඔක්තෝබර් 19 දිනැති උපදේශක කාරක සභා රැස්වීමේදී දන්වා ඇත. |
| (ඈ) | රාගම සතිපොල පවත්වාගෙන යාම වෙනුවෙන් 2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාලය වෙනුවෙන් රු:3,160,105 ක් බදු මුදල් වශයෙන් ගෙවීමට එකගවී 2017 දෙසැම්බර් 10 දින ගිවිසුම් ගතවී තිබූ අතර, ගිවිසුමේ කොන්දේසි උල්ලංගණය කරමින් රාගම නගරය පුරාම පොළ පවත්වාගෙන ගොස් තිබුණි. 2018 වර්ෂයේ මාසික බදු මුදල රු:263,342 ක් වුවද 2019 වර්ෂයේ | පොල නිශ්චිත සීමාවක් තුළ පවත්වා ගැනීමට හා ඉඩම තක්සේරු කර බදු මුදල තීරණය කළ යුතු වේ. | පොළ භූමිය තවදුරටත් විධිමත් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරුව සිදුකර ඇති අතර එම තක්සේරු වාර්තා ලැබුණු පසු පොළ භූමිය විධිමත් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

මාසික බදු මුදල රු:183,286 දක්වා අඩු කර තිබූ අතර පළාත් පාලන කොමසාරිස්ගේ 2016 ඔක්තෝබර් 09 දිනැති LGD/13/2016 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව බදු ඉඩමේ මාසික කුලිය, පිළිගත තක්සේරුව මත ප්‍රතිශෝධනය කර නොතිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු
----------------------------

(අ) උසාවි දඩ
-----------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහර මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2012 වර්ෂයේ සිට හා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් 2016 වර්ෂයේ සිට උසාවි දඩ අය වීමට තිබුණි. | උසාවි දඩ ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මහර මහේස්ත්‍රාත් අධිකරණයේ 2012 වර්ෂයේ සිට හා මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයේ 2016 වර්ෂයේ සිට උසාවි දඩ ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) මුද්දර ගාස්තු
-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොළඹ සහ ගම්පහ ඉඩම් රෙජිස්ටාර් කාර්යාල වලින් 2015 වර්ෂයේ සිට මුද්දර ආදායම් ලැබිය යුතුව ඇති අතර, ඒවා ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොළඹ සහ ගම්පහ ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ 2015 වර්ෂයේ මුද්දර ආදායම් උපලේඛන පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමු කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය
------------------------

3.1 කාර්ය සාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුඛ විහරණය පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) තිරසර සංවර්ධන ඉලක්ක
--------------------------

විගණන නිරීක්ෂණය නිර්දේශය ගණන්දීමේ නිලධාරියාගේ අදහස්

| | | දැක්වීම |
|---|---|---|
| ------------------------ | ------------- | --------------------------------------- |
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් ගෝලීය දර්ශක තුළින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 වර්ෂය වෙනුවෙන් සකස්කර නොතිබුණි. 2019 – 2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්ම පමණක් සකස්කර තිබුණි. | 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව අරමුණු, ඉලක්ක හා නියාමනය කිරීම සඳහා දර්ශකයන් හඳුනා ගත යුතුවේ. | 2018 වර්ෂය සඳහා තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයට අනුව සැළැස්මක් සකස් කිරීමට උපදෙස් නොලැබුණු බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
---------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------- | -------------- | ----------------------------- |
| (අ) | 2018 ඔක්තෝබර් 12 දින වන විටත් ඇස්තමේන්තු පිළියෙල නොකර කර්මාන්ත 04 ක වැඩ නිම කර තිබූ අතර, ඇස්තමේන්තු පිළියෙල කර තිබූ රු:2,799,000 ක් වටිනාකමැති කර්මාන්ත 05 ක් සඳහා ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව කටයුතු කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කර ගිවිසුම් ගත විය යුතු වේ. | මෙම කර්මාන්ත 04 සඳහා ඇස්තමේන්තු 2018 ඔක්තෝබර් 11 වෙනි දින කර්මාන්ත කමිටුව මඟින් අනුමත කරගෙන තිබූ අතර කර්මාන්තවල වැඩ ආරම්භ කිරීමට පෙර ගිවිසුම් සම්පූර්ණ කිරීම සිදු කරන බව දන්වමි. |
| (ආ) | රාගම බල ප්‍රදේශයේ පේරලන්ද මාවතෙහි වූ රූඩ් 3 පර්චස් 17 ක් වූ ඉඩමේ අනුබෙදුම සඳහා සැළසුම් කමිටුවේ අනුමැතිය ලැබී නොතිබුණි. තවද, අඩි 264 ක් දිග හා අඩි 10 ක් පළලින් යුත් උක්ත අනුබෙදුම් ඉඩම වෙත ප්‍රවේශ විය හැකි පේරලන්ද මාවතෙන් විහිදෙන අතුරු මාවත ප්‍රාදේශීය සභාව විසින් කොන්ක්‍රීට් කර | සභාව සතු මාර්ග නිත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම මාර්ගය ඇතුළු ප්‍රාදේශීය සභා මාර්ග පවරා ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට විධිමත් ක්‍රම වේදයක් අනුගමනය කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| | තිබුණද පවරාගෙන නොතිබුණි. | | |
| (ඇ) | වසර 9ක් ඉක්ම වූ රු.299,120 ක් වූ සේවක ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියා මාර්ග ගැනීම පිළිබඳ කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුවේ. | ගිණුම් උපදේශක මහතාගේ උපදෙස් ලබාගැනීමෙන් පසු ශේෂ නිවැරදි කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. |

3.3 වත්කම් කළමනාකරණය
--------------------------

වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම
------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඒකල පිහිටි අක්.29, රූඩ් 02, පර්චස් 12.81 ක් වූ සභාව සතු OTS ඉඩම 2016 වර්ෂයේදී ඉදිරි පස මායිම සඳහා යොදන ලද PVC දැල් ආවරණය යෙදීම හැරුණු කොට ඉඩමේ අනෙකුත් මායිම් ආවරණය කර අයිතිය සුරක්ෂිත කර ගැනීම සඳහා පියවර ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩමේ ස්ථිර මායිම් හඳුනා ගෙන ඇති අතර, මෙම ඉඩමේ මායිම් සම්පූර්ණයෙන්ම ආවරණය කිරීමේ කටයුතු සිදු කිරීම ඉදිරියේදී සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |

3.4 සභාවට එරෙහිව පවරා ඇති නඩු
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාඇල ප්‍රාදේශීය සභාව විසින් කඳාන පාතිමා මාවතේ අළුත්වැඩියා කටයුත්තක් සිදුකිරීමේදී ටෙලිකොම් සමාගමට අයත් භූගත සංඥාවට අලාභ හානි සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට සිදු වූ රු:56,285 ක අලාභය සම්බන්ධයෙන් 1311/ M අංක දරන නඩුව පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් ගෙවීමට සිදුවන අලාභය සම්බන්ධයෙන් ගිණුම් මගින් හෙළිදරව් කර නොතිබුණි. | ගෙවීමට සිදුවන අලාභ හානි සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමක් කළ යුතුවේ. | නඩු සඳහා දැරිය යුතු සියළු වියදම් සඳහා 105 9(1) වැය ශීර්ෂය යටතේ මුදල් වෙන් කර ඇති අතර, මෙම නඩුවට අදාළ වන්දි මුදල ගෙවීමට සිදු වුවහොත් මෙම වැය ශීර්ෂය මගින් ගෙවීම් සිදු කරනු ලැබේ. |
| (ආ) | කඳාන දුම්රිය පොළ පාරේ පදිංචිකරුවෙකු විසින් ගොඩනැගිල්ලකින් තම නිවසට සිදුවන අලාභහානි සම්බන්ධයෙන් සභාව ක්‍රියාත්මක නොවී තිබීම නිසා සභාවට විරුද්ධව නඩු පවරා තිබූ අතර, නඩුවට | වගකිව යුතු නිලධාරින්ට එරෙහිව කටයුතු කළ යුතුවේ. | මෙම නඩුවට අදාළ ලිපි ගොණුවක්ද නොමැත. දැනට අධිකරණයෙන් ලබා ගත් නඩු වාර්තාව අනුව ලිපි ගොනුවක් පවත්වාගෙන යන අතර, ගෙවිය යුතු වන්දි මුදල් |

| | | | |
|---|---|---|---|
| | සභාව වෙනුවෙන් නියෝජිතයෙකු පෙනී නොසිටීම හේතුවෙන් 2003 ජූලි 31 දින ඒකපාර්ශවීය තීරණයක් ලබා දී තිබුණි. ඉහත තීරණයට එරෙහිව නඩුවක් පවරා තිබුණ අතර, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි. | | මෙතෙක් නිශ්චිතව දක්වා නොමැත. එසේම මෙම නඩුව සම්බන්ධ තොරතුරු පළාත් පාලන කොමසාරිස් වෙත දන්වා යවා සුදුසු ක්‍රියා මාර්ගයක් ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | කුඩහකපොල බහුකාර්ය ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාලව ප්‍රතිපාදන නොලැබීම නිසා අත්තිවාරම පමණක් යොදා ඉදිකිරීම් කටයුතු නවතා තිබු හෙයින් කොන්ත්‍රාත් සමාගම විසින් තමන්ට සිදුවූ අලාභය සම්බන්ධයෙන් නඩුවක් ගොනු කර තිබූ අතර ඒ අනුව 2012 සහ 2013 වර්ෂ වලදී රු:2,403,319 ක වන්දියක් ගෙවා තිබුණි. ඉදිකිරීමට අදාළ ලිපි ගොනුව විගණනයට ලැබී නොතිබූ අතර, මේ වන විට මෙහි අත්තිවාරම ගලවා ඇති බව අනාවරණය විය. | අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින්ට එරෙහිව පියවර ගත යුතුවේ. | මෙම නඩුවට අදාළ ගොණුව සොයා ගැනීමට නොමැති අතර, නීතිඥවරයෙකු මගින් නඩුවාර්තාවේ සම්පූර්ණ පිටපතක් ලබා ගැනීමට කටයුතු කර ඇත. |

3. 5 ප්‍රසම්පාදනය
--------------

3.5.1 සැපයීම් හා සේවා
--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ආරක්ෂක සේවය සඳහා සිවිල් ආරක්ෂක සේවයේ මුරකරුවන් යෙදවීමට 2015 සැප්තැම්බර් මස 01 දින අත්සන් කර තිබු ගිවිසුමේ කොන්දේසි 8 ප්‍රකාරව පැය 24 ක දිවා රාත්‍රී සේවා මුර සැපයීම වෙනුවෙන් ආරක්ෂක නියාමකයින් 06 දෙනෙකු සේවා මුර 06 ක් යෙදවිය යුතුව තිබුණද 2018 ජූලි මාසයේ පැමිණීමේ ලේඛනය අනුව දින 03 ක් හැර අනෙකුත් දිනවල ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ආරක්ෂක නියාමකයින් 06 කට දිනකට සේවා මුර 05 ක් ලබා දීම සිදු කර ඇත. |